

# චීන කටු

අද අප බොහෝ දියුණු යැයි සැලකෙන ශාස්ත්‍ර කලා ආදී ශිල්ප බොහෝමයක ආරම්භය ගල් යුගය තෙක් දිවේ යැයි සඳහන් කළහොත් එය අතිශෝක්තියක් නොවේ. චීන කටු චිකිත්සාව ද, මෙබඳු ඉතිහාසයක් ඇති, ගල් යුගයේ මානවයන් අත්දුටුවාසේ ම නූතන දියුණු වෛද්‍ය ක්‍රම තුළින් ද අත් විඳිය හැකි ශ්‍රේෂ්ට ශාස්ත්‍රයකි.

චීන කටු වෛද්‍ය ක්‍රමයේ ආරම්භය සිදු වූයේ චීනයේ ය. චීන ජාතිකයන් විසින් මෙය සොයා ගත් නිසා එය චීන කටු චිකිත්සාව ලෙස හඳුන්වන අතර මේ වෛද්‍ය ක්‍රමයට අවුරුදු 5000 ක පමණ ඉතිහාසයක් තිබේ. මෙම ඉපැරණි චීන කටු වෛද්‍ය ක්‍රමය පිළිබඳ දේශීයව කතා කිරීමට බම්බලපිටියේ ඇති දේවී චීන කටු වෛද්‍ය ආයතනය හා සම්බන්ධ වීමු.



මහාචාර්ය වෛද්‍ය සෙල්වකුමාර්

දේවී වෛද්‍ය ආයතනය, චීන කටු ප්‍රතිකාර මඟින් රෝග සුව කරන ආයතනයක් පමණක් නොව, චීන කටු ප්‍රතිකාර උගන්වන ආයතනයක් ද වේ. චීන කටු ප්‍රතිකාර ක්‍රම උගෙන ඉන් පිට වී ගොස් ඇති සංඛ්‍යාව අති මහත් ය. මාස හයේ සිට අවුරුද්ද දක්වා වූ පාඨමාලා රාශියක් ඇති මෙම දේවී ආයතනය,

ලංකාවේ වෛද්‍ය විද්‍යායතනයක් ලෙස ලියාපදිංචි වී, ඇමරිකා එක්සත් ජනපදයත් සමඟ සම්බන්ධව පාඨමාලා පවත්වාගෙන යයි. චීන කටු ප්‍රතිකාර ක්‍රම ඉගෙනුමට කැමති සිසුනට මීට සම්බන්ධ වී එම පාඨමාලාවන් හැදෑරිය හැකි බව පවසන මහාචාර්ය වෛද්‍ය සෙල්වකුමාර් මහතා චීන කටු වෛද්‍ය විද්‍යාව පිළිබඳ අදහස් දැක්වීය.

චීන කටු මළ නො බැඳෙන වානේ වලින් සාදා තිබේ. ඉතා සියුම් කටු විශේෂයක් වන එය රෝගියා ගේ ශරීරයට ප්‍රවේශ කිරීමේ දී දරා ගත නො හැකි තරම් වේදනාවක් ඇති නොවේ.

විවිධ ප්‍රමාණ වලින් යුතු චීන කටුවල දිග දැක්වීම සඳහා භාවිත කර ඇත්තේ "ත්සුන්" නම් චීන මිනුම් දණ්ඩකි. මෙය සාමාන්‍ය වැඩුණු පුද්ගලයකු ගේ මැදඇඟිල්ලේ මුල් පුරුක තරම් වේ. (සෙන්ටිමීටර් 3 න් පමණ) විවිධ ප්‍රමාණවල චීන කටු විවිධ රෝග සඳහා භාවිත කෙරේ. ඒ ශරීරයේ ඇති නිල ස්ථාන උත්තේජනය කිරීමට යොදා ගනිමිනි. චීන කටු ප්‍රතිකාර මඟින් අතුරු ආබාධ ඇති නොවේ.

රෝග සුව කිරීමට බෙහෙත් පෙති සඳහා අධික මුදලක් වැය කෙරෙන මෙවැනි කාලයක චීන කටු ප්‍රතිකාර සඳහා වැඩි මුදලක් වැය නොවේ. ප්‍රතිකාර නිසා මානසික සංයමය ඇති වේ. කටු චිකිත්සා ප්‍රතිකාරවලින් පසු නිල ස්ථාන අතින් සම්බාහනය කිරීමත්, අවශ්‍යතාව මත රෝගීන් හට ලේසර් ප්‍රතිකාර ලබා දීමත් සිදු කෙරෙයි. ඊට අමතරව කායික චිකිත්සක ව්‍යායාම ද ලබා දෙයි. මෙමඟින් බටහිර වෛද්‍ය ප්‍රතිකාර මඟින් සුව කිරීමට කල් ගතවන රෝග ද සුව කළ හැකිය.

බටහිර වෛද්‍ය ක්‍රමයෙන් සුව කළ නොහැකි එහෙත් පාලනය කළ හැකි රෝග ලෙස සැලකෙන දියවැඩියාව, ඇදුම, පීනස, සමේ රෝග වන සුදු කබර, පොතු කබර, දද, කුෂ්ට, අංශභාග, ආතරයිටිස්, හිසකෙස් ගැලවීම, හන්දිපත් වේදනාව, අධික රුධිර පීඩනය සහ හෘද රෝග ද චීන කටු ප්‍රතිකාර මඟින් සුව කළ හැකි අතර, ඒවාට අමතරව සිගරට්, මත් පැන්, මත් කුඩුවලට ඇබ්බැහි වීම, දරුපල නොමැතිවීම, පාකින්සන් රෝගය, මුත්‍රා රෝග, ආර්තවයට ප්‍රථම ඇති වන රෝග, මානසික ආබාධ ඉරුවාරදය, හානි වූ දෘෂ්ඨිය, හානි වූ ඇසීම, ඇදුම කථන දුර්වලතා, මළ බද්ධය, අපස්මාරය ස්ථූලතාව වැනි රෝග සඳහා ද සාර්ථකව ප්‍රතිකාර කළ හැකි ය. රෝගය සුව කිරීමට ගත වන කාලය තීරණය වන්නේ රෝගියා ගේ ශරීරයේ තත්ත්වය සහ රෝගයේ තත්ත්වය අනුව ය.

ඖෂධ මඟින් බොහෝවිට කෙරෙනුයේ තාවකාලිකව රෝග සුවපත් කිරීම ය. ඒ නිසා ඖෂධ බලය හීන වී ගිය පසු රෝගය නැවතත් මතු වේ. එහෙත්, චීන කටු චිකිත්සක ප්‍රතිකාර මඟින් සියලුම නිදන් ගත රෝග මාස තුනක් වැනි කෙටි කලක දී සුව කළ හැකිය.

ඡායාරූප
**කුමාරි තල්පාවිල**

**ඉන්දික කුඩාහෙට්ටි**

**රෝග සුව කිරීමට බෙහෙත් පෙති සඳහා අධික මුදලක් වැය කෙරෙන මෙවැනි කාලයක චීන කටු ප්‍රතිකාර සඳහා වැඩි මුදලක් වැය නොවේ. ප්‍රතිකාර නිසා මානසික සංයමය ඇති වේ. කටු චිකිත්සා ප්‍රතිකාරවලින් පසු නිල ස්ථාන අතින් සම්බාහනය කිරීමත්, අවශ්‍යතාව මත රෝගීන් හට ලේසර් ප්‍රතිකාර ලබා දීමත් සිදු කෙරෙයි. ඊට අමතරව කායික චිකිත්සක ව්‍යායාම ද ලබා දෙයි. මෙමඟින් බටහිර වෛද්‍ය ප්‍රතිකාර මඟින් සුව කිරීමට කල් ගතවන රෝග ද සුව කළ හැකිය.**

